# මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය
# ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත්කර ගැනීම - 2020 / 2021

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, **දියගම, හෝමාගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.**

**1.** ***සාමාන්‍ය :***

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑඅවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ.

**(අ) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)**

(i) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(ii) නෞකා චලන අධ්‍යයන හා තාක්ෂණය

**(ආ) අනිකුත් අධ්‍යයන ක්ෂේත්‍රයන් (Set 2)**

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) තොරතුරු තාක්ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vii) පොලිමර් තාක්ෂණය
(viii) පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

**2.** ***යෝග්‍යතාවය :***

**2.1** ***වයස:***

(අ) 2019.12.31 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 වැඩි නොවිය යුතුය.

(ආ) නෞකා චලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2019.12.31 දිනට වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත්විය යුතුවේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

**2.2** ***අධ්‍යාපන සුදුසුකම්:***

(අ) 1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017, 2018 හෝ 2019 වසරේ පවත්වන ලද අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් සමත්විය යුතුය.

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

(ආ) "නෞකා චලන අධ්‍යයන තාක්ෂණය" හා "නාවුක ඉංජිනේරු තාක්ෂණය" යන පාඨමාලාවන් සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් හට අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන (C) සාමාර්ථයක් තිබීම අනිවාර්යය වේ.

## 3. තෝරා ගැනීමේ පදනම / ක්‍රියාපරිපාටිය :

### 3.1 පාඨමාලාවට ඇතුලත් කර ගැනීම :

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්‍ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්‍ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්‍ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ.පො.ස. (උ.පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත (Z ලකුණු මත)සිසුන් තෝරාගනු ලැබේ. 40% ක් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60% ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

### 3.2 අධ්‍යයන ක්‍ෂේත්‍රය :

යෝග්‍යතා පරීක්‍ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්‍ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්‍ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

## 4. අයදුම් කිරීමේ පිළිවෙල :

### 4.1 අයදුම්පත් පෝරම :

(i) ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.
**http://www.itum.mrt.ac.lk**

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "**ජාතික තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඇතුලත් වීම - 2020 / 2021**" යනුවෙන් සඳහන් කර **ලියාපදිංචි තැපැලෙන්** පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත **"සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්‍ෂණික ආයතනය, දියගම, හෝමාගම"**. යන ලිපිනයට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර එවිය යුතුය

(iv) තම ලිපිනය ලියන ලද රු. 45/= ක් වටිනා මුද්දර අලවන ලද 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

(v) අයදුම්පත සමඟ අ.පො.ස. (උ.පෙළ) සහතිකවල සහතික කළ පිටපත් එවීම අවශ්‍ය වන අතර අයදුම්පතේ සඳහන් තොරතුරු පිළිබඳවද සහතික කර තිබිය යුතුය(අයදුම්පතේ 03 සහ 05 යන ජේද බලන්න).

### 4.2 අධ්‍යයන ක්‍ෂේත්‍රයන් තෝරා ගැනීම:

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 1) හෝ අනිකුත් අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කල හැක. ක්‍ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම්කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කල යුතුය.

(iii) නාවික අධ්‍යයන ක්‍ෂේත්‍ර කාණ්ඩයේදී එනම් නාවුක ඉංජිනේරු තාක්‍ෂණය සහ නෞකා වලන අධ්‍යයන තාක්‍ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්‍ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කල යුතුය.

(iv) අනිකුත් ක්‍ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1,2,3,4,5,6,7,8 සඳහන් කල යුතු අතර වඩාත් කැමති ක්‍ෂේත්‍රය 01 ලෙස ද ඊළඟ ක්‍ෂේත්‍රය 02 ලෙස ද අන්තිම ක්‍ෂේත්‍රය 08 ලෙස සඳහන් කල යුතුය.

**5.**

(i) **ඉල්ලුම් පත්‍ර ගාස්තු :**

ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍ර කාණ්ඩයක් සඳහා රු. 500.00 (පන්සීයයක්) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා නම් රු. 700.00 (හත්සීයයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් **"මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ ගිණුම් අංක 0000308280"** දරණ ගිණුමට බැර වනසේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020.11.13 දින වේ.

**6.** ***යෝග්‍යතා පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණය :***

අයදුම්කරුවන් විසින් අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ලබාගත් ප්‍රතිඵල, කුසලතා පදනම මත හා එක් එක් දිස්ත්‍රික්කයට අදළ ලඝු කළ සිසුන් ප්‍රමාණය මත, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය *හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණය* සඳහා කැඳවනු ලැබේ.

*ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පරීක්ෂණයට අදාල අධ්‍යයන අධාරක සටහන්* වෙබ් අඩවියට (**http://www.itum.mrt.ac.lk**) පිවිසීමෙන් ලබා ගත හැකිය.

**7.** ***පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :***

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල **මුල් පිටපත්** ඉදිරිපත් කළ යුතුය.

- අ.පො.ස. (උ.පෙළ) සහතිකය
- අ.පො.ස. (උ.පෙළ)Z ලකුණු සඳහන් සහතිකය
- පාසැල් හැරයාමේ සහතිකය
- උප්පැන්න සහතිකය
- සහතිකපත්වල හා අදළ ලියකියවිලවල නමෙහි යම් වෙනසකම ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්

**8.** **ඉතා වැදගත්**

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුලදී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(iii) අයදුම්පත්‍රයේ සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් ලෙසකින් තොරතුරු අසත්‍ය බව හෙළිවුවහොත් ඒ සම්බන්ධ ව ආයතනය විසින් ගන්නා ඕනෑම තීරණයකට අයදුම්කරු එකඟ විය යුතුය.

නිසි බලධාරී
තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව